# මේ කවුද ? මොනවද කරන්නේ ?




ඕහු දේශපාලකයෙකු හෝ කලාකරුවෙකු විය හැකිය. කාර්මිකයෙකු හෝ වෙනත් රැකියාවක නියුතු වූවෙකුද විය හැකිය. කාන්තාවක හෝ පිරිමියෙකු මෙන්ම ලාබාල මෙන්ම මහලු අයෙකු වුවද විය හැකිය. මේ කවුද ... ? මේ අන් කිසිවකු නොව මම නොහොත් ඔබය. එසේ නම් මම කුමක් කරම්ද ?

මම දකිමි - අසමි - සුවඳ සහ රස විඳිමි - පහස ලබමි - එසේම සිතමි. ඔබද එසේමය. එහෙත් මේ බැව් සැබවින්ම අපි දන්නෙමුද ? ඇතැම්විට දන්නවා විය හැකිය. එහෙත් සිතන්නෙමුද ? ඇතැම්විට සිතනවාද විය හැකිය. එහෙත් එදා මෙදා තුර ජීවත් වූ බොහෝ දෙනෙකුට ඉතාම අල්ප මාත්‍ර දැනුමක් ඇත්තේ තම තමන් ගැනමය. සහ තම තමන් සැබැවින්ම කරන කියන දේවල් ගැනය.

වෙසක් සඳ නැගී එන සමය අපගේ සිත් අපගේම සිත් ගැන සිතීමට යොමු කිරීමට ඉතාමත්ම සුදුසුම කාලය වන්නේය. ලෝකයේ හට ගැනීමත්, ලෝකයේ නැවතුමත් මේ බඹයක් පමණ වන ශරීරය මුල් කොට ගෙන වදාරන ලද්දේ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විසිනි. සැබැවින්ම මේ බඹයක් පමණ වන සිරුරත් ඒ ඇසුරු කළ සිතත් නැති කල්හි මා කොයින්ද ? ලෝකය ගැන කවර කතාද ?

මා ගැන මා සිතන කල මා යැයි මට සිතෙන්නේ කවර දේවල් ගැනද? පළමුවෙන්ම කේෂාන්තයේ සිට පාදාන්තය තෙක් ප්‍රමාණ කර ගත් සිරුර මා යැයි මට සිතේ. එබැවින් මෙම සිරුර බාහිර උපද්‍රවයන්ගෙන් සහ අතුරු ආන්තරාවන්ගෙන් රැක ගැනීමට මම වෙහෙස වෙමි. මගේ සිරුර ගැන එසේ සිතෙන කල කැඩෙන බිඳෙන බඳුනක් පරිස්සමෙන් පරිහරනය කරන අයුරින් මට මගේ සිරුර රැක ගැනීමට සිතෙයි. එහෙත් බාහිර ලෝකයේ නොමැති කිසිවක් මේ සිරුරේ ඇත්ද ? බාහිර ලෝකයේ පවතින තද, වැගිරෙන, හමායන සහ ශ්‍රීතෝෂ්ණාදී සියලුම මූල ධාතු මේ සිරුර තුළද පවතී. මැටිටෙන් සැදූ වළඳක් මෙන් බාහිර ලෝකයේ පවත්නා ද්‍රව්‍යයන්ගෙන් සැදුනු මේ සිරුර ලෝකයේම කොටසක් ලෙස මිස එහි මා යනුවෙන් වෙන්කර හඳුනා ගත හැකි මටම ආවේණික කිසිවක් සොයාගැනීමට නොහැකිය. මේ රූපයේ සැබැවින්ම මා යැයි ගත හැකි කිසිවක් නොවන බව හැඟෙන විට කලක් බාහිර ලෝකයාට මා පෙන්වූ ලස්සනයැයි මා සිතා සිටි මගේ රූපය ගැනත්, දෑතේ දෙපයේ පිරුණු මස් ගොඹ ගැනත් මට දැණුනේ පොළව පළාගෙන යන තරමේ ලජ්ජාවකි. මෙබඳු වූ කුළියට ගත් ද්‍රව්‍යයන්ගෙන් සැදුනු සිරුරක් ඇති අප මිය ගිය දිනක කෙසේ නම් අප වෙනුවෙන් ස්මාරකයක් සකස් කිරීමට අපි ඉඩ දෙමුද?

මේ රූපය මම නොවේ නම් මම යනු අන් කිසිවක්ද ? මම තව දුරටත් සිතන්නට විමි. මගේ පාදයක් කිසියම් දෙයක ගැටුණු කල්හි මට දැඩි වේදනාවක් දැනේ. ඇවිද වෙහෙස වූ විට කිසිවෙකු මගේ දෙපය පිරිමදී නම් එවිට මට සැප වේදනාවක් දැනේ. රසය, දර්ශනය, ශබ්දය සහ සිතිවිළිද මට දැනෙන වේදනාවන් සැප හා දුක අතර දෝළනය කරයි. මේ භෞතික සිරුරේ සොයා ගත නොහෙනු "මම" මට දැනෙන වේදනාවන් තුළ ඇතැයි මට සිතෙයි. සැබැවින්ම මේ වේදනාවන් මමද? නැතිනම් වේදනාවන් විඳින්නේ මමද? ගසකට ජලය මද වීමද, අධික වීමද හානිකරය. ඒ අයුරින්ම මා ලබන වේදනාවන්ද මා තුළ ඇති කරනුයේ කළකිරීම්ය. රසවත් ආහාරයක් කැමැති තරමට නොලැබුණු කල්හි මම දුක් වෙමි. එසේම අවැසි පමණට වඩා පරිභෝජනය කළ පසුද මම ඒ ගැන දුක් වෙමි. මුළු ජීවිතයම වේදනාව නැමැති කතරක මංමුළාවී ඇත්තාක් සේ මට හැඟේ. එකල්හි හේතූන් නිසා ඇතිවන, එම හේතු නැති වීමෙන් නැතිවන වේදනාවන් තුළ මම ඇතැයි සිතීමත්, කලින් මෙන් සිරුරේ රූප කලාප තුළ "මම" ඇතැයි සිතීමත් අතර වෙනසක් මට නොපෙනී යන්නේය. නොයේක් අරමුණු කෙරෙහි වන පිළිගැනීමත් නොපිළිගැනීමත් වේදනාව (සැප හෝ දුක්) ලෙස පෙනෙන කල්හි "මම" ඇතොත් ඇත්තේ මීටත් වඩා ගැඹුරු තැනක විය යුතුයැයි මට සිතේ.

භාෂාවක් නොතිබුණි නම් මම කෙසේ සිතන්නෙම්ද ? අසන දකින විඳින හැම දේයකටම මා මටත් හොරා වචන ඔබන බව මම දනිමි. මෙය යමක් සපුරා විඳින්නට ඇති හැකියාව සොරා ගැනීමක්ද ? අම්මා, තාත්තා, පොත, මේසය යනාදී වශයෙන් බාහිර ලෝකයේ මෙන්ම මා තුළද සළකුණු කරගැනීම් කරගෙන ඇත. මේ සළකුනු ඇති කරගන්නේ මමද? පාරේ වාහනයක් පැද යන කල්හි රතු සංඥා එළි දැල්වෙන කල්හි අපි වාහන නවත්වමු. පෙනෙන්නට ඇත්තේ රතු සංඥාව පමණක් වුවද, පාර, බල්බය, වාහනය, තිරිංගය, නැවැත්ම යනාදී දහසකුත් එකක් සංඥා සමූහයක් චේතනිකව හෝ අචේතනිකව කරපින්නාගෙන සිටින්නේ මමද? එයා හොඳයි, මෙයා නරකයි යනුවෙන්ද, ඔවුන් නිවැරදියි, මොවුන් වැරදියි කියාද, මම නිමිති ගෙන සළකුණු ඇති කරගනිමි. එබැවින් රූපයටත්, වේදනාවටත් වඩා සංඥාවෝ - හඳුනාගැනීම් - තුළැ මා සැඟ වී ඇතැයි මට සිතෙයි. එසේනම් මේ ලෝකයේ භාෂාවේ පටන් රූප, ශබ්ද, ඝන්ධ, රස, ස්ඵර්ෂ සහ චේතනා ඇතුලු සියලුම දේ හඳුනා ගෙන ඒ අනුව කටයුතු කරන්නේ මමද? නැතිනම් හඳුනාගැනීම් - සංඥාවෝ - මමද? සංඥාවෝ මතු නොව සංඥා කරනු ලබන දේද ඇතිව නැතිවන්නේය. ඇස නිසා දකින රූප මොහොතක් මොහොතක් පාසා වෙනස් වනු අපි දකිමු. එහෙත් එම රූප දකින අපගේ ඇස නැමති රූපයද වෙනස් වී යන අයුරු අපි දකිමුද? මේ විශ්වයේ ඇතිව නැතිවන සියලුම දේ පිළිබඳව මා මනිනුයේ මගේ මිණුම් දණ්ඩෙනි. එහි දිග පළල තීරණය කරනුයේද මවිසින්මය. එබැවින් මේ ලෝකයේ මැවුම්කරුවා මා හෙවත් මාගේ හඳුනා ගැනීම් සමූහය ය.

එහෙත් හුදෙක් මා විසින් කරනු ලබන හඳුනා ගැනීම් අතර තුර මට තවත් කල්පනාවක් ඇති විය. ඒ කල්පනාවන් ගැන කල්පනාවය. එකල්හි මා ඇත්තේ හඳුනා ගැනීම් තුළ නොව කල්පනාවන් හෙවත් චේතනාවන් පහළ කිරීම තුළ විය හැකි යැයි මට සිතෙන්නට විය. ඇසට රූප පෙනෙන විට ඒ නිසා ඇතිවන වේදනාවන්ද, හඳුනා ගැනීම්ද, ඒ අනුව කල්පනා නොකළේ නම් ඇති වේද? අසට රූපයක් පෙනුනද ඒ අනුව කල්පනා නොකළේ නම් එය රූප පෙනීමටවත්, රූප නිසා වේදනා ඇතිවීමටත්, හඳුනා ගැනීමටත් වලංගු නොවේ. කෙනෙක් දෙනෙත් ඇරගෙන ඇත බලාගෙන කල්පනාවක නිමග්නව සිටියි. ඔහු ඉදිරියෙන් කුරුල්ලෙක් පියඹා යයි. මේ දුටු තවත් කෙනෙක් පියඹා ගිය කුරුල්ලා ගැන විමසයි. එහෙත් දෙනෙත් ඇරගෙන සිටියද, ඒ දෙනෙත ඉදිරියෙන් කුරුල්ලා පියඹා ගියද කල්පනාව වෙනෙතක වූ හෙයින් ඔහු එය නොදිටීය. එබැවින් කල්පනාව හෙවත් චේතනාව මෙහෙය වීම "මම" යැයි ගැනීම වඩාත් සුදුසු යැයි මට සිතෙන්නට විය. මක්නිසාද යත් චේතනාව නොවිණි නම් ඇස්, කන් නාසා තිබුණද මා හා නොදකින, නොඅසන සහ නොවිඳින කෙනෙකු අතර වෙනසක් නොවීමය. රූප, ශබ්ද, ඝන්ධ, රස, ස්ඵර්ෂ ගැන ඇති වන්නාවූ චේතනාවෝ කයෙන්, වචනයෙන් හෝ සිතින් ක්‍රියා කරවීමට මාව පොළඹවයි. යහපත් හෝ අයහපත් ක්‍රියාවන් සිතින්, කයෙන් හෝ වචනයෙන් කරවීමට තරම් බලගතු මේ චේතනාව වාහනයක් සුක්කානමක් මෙන් මා ගමන් කරන මග තීරණය කරවන බව මට මදින් මද කල්පනා වෙන්නට විය.

ඒ එසේ වුවද චේතනාවන් පහළ වන්නේ ඇස, කණ, දිව, නාසය, සිරුර සහ මනස මුල් කරගෙනය. සියලු සිත් පහළ වන්නේ මෙම ආයතන් හය මුල්කරගෙනම නොවේද? එබැවින් චේතනා ඇති වීම තුළට වඩා සිත හෙවත් විඤ්ඤාණය තුළ මම ඇතැයි සිතීම සුදුසු යැයි මට සිතෙන්නට විය. එබැවින් ඇසේ, කණේ, දිවේ, නාසයේ, සිරුරේ සහ මනසේ ඇති වන විඤ්ඤාණය මම විය යුතුය. එහෙත් නාම-රූපයෙන් තොර කවර නම් විඤ්ඤාණයක්ද

> *චිත්‍රපටයක් නරඹනවාක් මෙන් මා, මා දෙසැම බලා සිටින කල ලෝකයේ හට ගැනීමත්, හට ගැනීමේ හේතුවත් මේ ඔබයක් පමණ වූ සරීර කුඩුවෙහි ලා සිර කළ කුරුල්ලෙක් දෙස බලා සිටින අයුරින් දිස් වන්නට විය.... එසේ නම් මේ ලෝකයේ නැවැත්මත් මේ තුළැම තිබිය යුතුය.... මේ සියලු කල්පනාවන් තුළ වූ "මම" යන බැඳීම (උපාදානය) බිඳී ගියේ නම් තිබිය හැක්කේ සිදුවීම් සමුදායක් පමණක්ම යැයි ගැනීම අසාධාරණ විය නොහැකිය ... රහතන් වහන්සේලා නොගැටෙන්නේත්, නොඇලෙන්නේත් තමා ගැන පවා සිදුවීම්, සිදුවීම් මාත්‍රයක් හැටියට ප්‍රත්‍යක්ෂයෙන් දත් නිසා විය හැකිය. එකල්හි උන් වහන්සේලා කා සමඟ ගැටෙන්නද ? නැතිනම් ඇලෙන්නද ?*

? (* පටිච්ච සමුප්පාදය කියවන්න) එකිනෙකට මුහුණ ලා නොවැටී තිබෙන බට මිටි දෙකක් මෙන් නාම-රූප ඇති කල්හි විඤ්ඤාණයද, විඤ්ඤාණය ඇති කල්හි නාම රූපද පවතන බව බු නම්...... ? මා නැවතත් මෙම සිතිවිලි චාරිකාවේ ආරම්භයට යන්නාක් මෙන් හැඟේ. චිත්‍රපටයක් නරඹනවාක් මෙන් මා, මා දෙසැම බලා සිටින කල ලෝකයේ හට ගැනීමත්, හට ගැනීමේ හේතුවත් මේ ඔබයක් පමණ වූ සරීර කුඩුවෙහි ලා සිර කළ කුරුල්ලෙක් දෙස බලා සිටින අයුරින් දිස් වන්නට විය.... එසේ නම් මේ ලෝකයේ නැවැත්මත් මේ තුළැම තිබිය යුතුය.... මේ සියලු කල්පනාවන් තුළ වූ "මම" යන බැඳීම (උපාදානය) බිඳී ගියේ නම් තිබිය හැක්කේ සිදුවීම් සමුදායක් පමණක්ම යැයි ගැනීම අසාධාරණ විය නොහැකිය ... රහතන් වහන්සේලා නොගැටෙන්නේත්, නොඇලෙන්නේත් තමා ගැන පවා සිදුවීම් සිදුවීම් මාත්‍රයක් හැටියට ප්‍රත්‍යක්ෂයෙන් දත් නිසා විය හැකිය. එකල්හි උන් වහන්සේලා කා සමඟ ගැටෙන්නද ? නැතිනම් ඇළෙන්නද ?

අපි බොහෝ විට අපි ගැන සිතමු. එසේම අප බොහෝ විට නොසිතන්නේද අප ගැනමය. අපි ගැන සිතන්නෙමු යන්නෙහි තේරුම අපේ ගේ, අපේ ළමයි යනාදී වශයෙනුත්, අපි හොඳයි, නිවැරදියි හෝ වැරදියි යනුවෙනුත් සිතීමය. අපි අප ගැන නොසිතමු යන්නෙහි තේරුම නම්, අප අපි යැයි සලකා ක්‍රියා කරන්නේ කවරක් අරබයාද යන්න නොසිතීමය. දැනුවත්ව හෝ නොදැනුවත්ව මා, "මම" යැයි සිතන්නේ මගේ රූපය ගැනය. නැතිනම් මා විඳින වේදනාවන් ගැනය. නැතිනම් මගේ හඳුනා ගැනීම්, මගේ චේතනාවන් හෝ සිත ගැනය. මේ නොසිතන මා ගැන සිතීමට දරන උත්සාහය මා හඳුනා ගැනීමටත්, මා සැබවින්ම කුමක් කරන්නේද යන්න වටහා ගැනීමටත් ඉවහල් වන්නේය. එකල්හි මම යනු සිදුවීම් සමුදායක් මිස සත්ත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ ආත්මයක් නොවන බව පිළිගැනීමට හේතු වන්නා වූ සාධක මසැසට නොව මනැසට ගෝචර වන්නට පුළුවන. එසේම ඒ බැව් ප්‍රත්‍යක්ෂයෙන් වටහා ගැනීමට කවරෙකු හෝ වෙර දරන්නේ නම් එය බුදුරජාණන් වහන්සේ දැක ගැනීමට ගන්නා වූ අද දවසේ කාලීන ප්‍රයත්නයක් වශයෙන් හඳුන්වා දීම නිවැරදි නොවන්නේද .... ?

**සාමන්ත තැන්නගේ**